# කළුතර අධ්‍යාපන කලාපය

## 13 ශ්‍රේණිය - අවසාන වාර පරීක්ෂණය - 2022 ජනවාරි
## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

| | | | |
|---|---|---|---|
| ආර්ථික විද්‍යාව I<br>Economics I | 21 | S | I | පැය දෙකයි<br>Two Hours |

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන කතිරයක් (X) යොදා දක්වන්න.**

(01) යථාතුරූපී ප්‍රකාශයක් පිළිබිඹු වන ලක්ෂණ ඇතුළත් නිවැරදි පිළිතුර වනුයේ,

(a) පුද්ගල බද්ධ වේ. (b) ප්‍රකාශන මූල කරුණු මගින් නිරවද්‍යතාවය සනාථ කළ හැක.

(c) වීය යුත්තේ කුමක් ද යන්න විග්‍රහ කරයි.

(d) විෂය බද්ධ වේ. (e) විද්‍යාත්මක ස්වරූපයක් ගනී.

1) a , b , c 2) a , c , e 3) b , d , e 4) b , c , d 5) a , b , e

(02) පහත සම්පත් අතුරින් ප්‍රතිස්ථාපනය කළ නොහැකි සම්පතක් වනුයේ,

1) මත්ස්‍ය සම්පත 2) තෘණ භූමි 3) ස්වභාවික ගෑස් 4) වනාන්තර 5) වන සතුන්

(03) වෙළඳපොළ ආර්ථිකය ස්ථාපිත කොට ඇති ප්‍රධාන ස්ථම්භ වනුයේ,

1) පෞද්ගලික දේපොළ, පෞද්ගලික ව්‍යවසාය ස්වාර්ථය හා තේරීමේ නිදහස.
2) නිදහස් ව්‍යවසාය, නිදහස් තේරීම, සාහුමිල හා ස්වාර්ථය
3) පෞද්ගලික ව්‍යවසාය, මිල යාන්ත්‍රණය ස්වාර්ථය, රාජ්‍ය නිර්බාධවාදයයි.
4) පාරිභෝගික වරණය, පාරිභෝගික ස්වාධිපත්‍යය, මිල ක්‍රමය හා ස්වාර්ථය මතයි.
5) මිල යාන්ත්‍රණය, සාහුමිල, ලාභය හා පෞද්ගලික වරණය මතයි.

(04) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක හැඩය තීරණය වනුයේ,

1) ආර්ථිකය සතු සම්පත් ප්‍රමාණය මතයි. 2) තාක්ෂණයේ කාර්යක්ෂමතාවය මතයි.
3) ආවස්ථික පිරිවැය අනුපාතයේ හැසිරීම මතයි. 4) ශ්‍රම බලකායේ කාර්යක්ෂමතාවය හා නිපුණතාවය මතයි.
5) සම්පත්වල ඵලදායිතාවය මතයි.

(05) කිසියම් භාණ්ඩයක් සඳහා ඉල්ලුම් පූර්ණ අනම්‍ය වන බවත් නිෂ්පාදකයින් එම භාණ්ඩයේ මිල 20%කින් ඉහළ නංවන බවත් සිතන්න. ඒ අනුව නිෂ්පාදන ආදායම,

1) 20%කින් ඉහළ යයි. 2) නොවෙනස්ව පවතී. 3) 20%කින් පහළ යයි.
4) 1%කින් ඉහළ යයි. 5) අනන්තය දක්වා ක්‍රමයෙන් පහත වැටේ.

(06) පහත දක්වෙන්නේ කිසියම් භාණ්ඩයක් සම්බන්ධ මිලත් ප්‍රමාණයත් පිළිබඳ දත්තයන්ය.

| P | Qd |
|---|---|
| 10 | 100 |
| 12 | 80 |

මෙහි මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය වනුයේ,

1) 1 කි. 2) 1.5 කි. 3) 1.22 කි. 4) 2.3 කි. 5) 0.8 කි.



Scanned with CamScanner

(07) සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක මිල රු. 10දී ඉල්ලුම් ප්‍රමාණය 500කි. එම ඉල්ලුමේ මිල නම්‍යතාවය 0.8කි. ඉල්ලුම් ප්‍රමාණය 300ක් වනුයේ කවර මිලකදීද?

1) මිල රු. 20 දී 2) මිල රු. 10 දී 3) මිල රු. 05 දී 4) මිල රු. 15 දී 5) මිල රු. 8 දී

(08) නිෂ්පාදන ආයතනයක සැපයුම් වක්‍රයට අදාළ සැපයුම් සමීකරණය $QS = -100 + 4P$ නම් එම ආයතනයේ,

| | නම්‍යතාව | නම්‍යතා සංගුණකය |
|---|---|---|
| 1) | අනම්‍ය වේ | වක්‍රය දිගේ ඉහළට යන විට නම්‍යතාවය ක්‍රමයෙන් අඩු වේ |
| 2) | නම්‍ය වේ | වක්‍රය දිගේ ඉහළට යත්ම නම්‍යතාව ක්‍රමයෙන් වැඩි වේ |
| 3) | අනම්‍ය වේ | වක්‍රය දිගේ ඉහළට යත්ම නම්‍යතාව ක්‍රමයෙන් වැඩිවේ |
| 4) | නම්‍ය වේ | වක්‍රය දිගේ ඉහළට යත්ම නම්‍යතාව ක්‍රමයෙන් අඩුවේ |
| 5) | ඒකීය නම්‍ය වේ | වක්‍රය මත ඕනෑම ලක්ෂණයකදී නම්‍යතාව නොවෙනස් වේ. |

(09) වෙළඳපොළක් වීම සඳහා අවශ්‍ය ලක්ෂණ වනුයේ අදාළ ගනුදෙනුව සම්බන්ධයෙන්,

1) ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් මුණ ගැසීමයි.
2) ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් පූර්ණ එකඟතාවයකට පත් වීමයි.
3) ගැනුම්කරුවන්ගේ හා විකුණුම්කරුවන්ගේ අදහස් සන්නිවේදනය හා සම්බන්ධීකරණය වීමයි.
4) ගැනුම්කරුවන්ගේ විකුණුම්කරුවන්ගේ සැලසුම් එකිනෙක ගැළපීමයි.
5) ඉල්ලුම් සැපයුම් බලවේග තුලනය වීමයි.

(10) තරඟකාරී වෙළඳ පොළක අලෙවිවන භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් සමීකරණය $QD = 190-2P$ වේ. වෙළඳපොළ සමතුලිත මිල රු. 80ක් නම් පාරිභෝගික අතිරික්තය වනුයේ,

1) රුපියල් 225කි 2) රුපියල් 2400 කි. 3) රුපියල් 380කි.
4) රුපියල් 80කි. 5) රුපියල් 190 කි.


(11) පහත දැක්වෙන්නේ කිසියම් භාණ්ඩයක් සම්බන්ධ ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව පිළිබඳ තොරතුරුය.

$(ES = 0.5 , ED = 0.5)$

එම භාණ්ඩය මත රු. 6.00ක බද්දක් පැනවූයේ නම් බද්දෙන් ගැනුම්කරු දරන ප්‍රමාණය හා විකුණුම්කරු දරන ප්‍රමාණය පිළිවෙළින් දැක්වෙන්නේ,

1) 4 , 2 2) 2 , 4 3) 3 , 3 4) 5 , 1 5) 1 , 5

(12) පහත රූප සටහන මගින් දක්වෙන්නේ රජය විසින් කිසියම් භාණ්ඩයක් සඳහා උපරිම මිල නියම කිරීම සම්බන්ධතාවයකි.





$P_1$ මිල ඵලදායීව ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුණේ නම් B හා D යනු,

1) නිෂ්පාදක අතිරික්තයේ කොටසකි. 2) නිෂ්පාදකයේ ලාභයට එන එකතුවකි.
3) පාරිභෝගික අතිරික්තයේ කොටසකි. 4) රජයේ ආදායමට එකතුවකි.
5) නිෂ්පාදකයාට අහිමි වන කොටසකි.



Scanned with CamScanner


(13) 


වෙළඳපොළ මිල පහත දමීමේ අරමුණින් රජය රු.10 බැගින් වූ මිල යටතේ භාණ්ඩය ආනයනය කරන්නේ නම් රජයේ ආනයනික වියදම වනුයේ,

1) රු. 1500කි.   2) රු. 500කි.   3) රු. 2000කි.

4) රු. 1000 කි.   5) රු 50 කි

(14) පහත රූප සටහන කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා වන තරඟකාරී වෙළඳපොළක් නිරූපණය කරයි.




මෙම භාණ්ඩය මත රජය $P_2$ හි අවම මිලක් නියම කොට එම මිල යටතේම අතිරික්ත සැපයුම මිලට ගන්නේ නම් අවම මිලට පසු පාරිභෝගික අතිරික්තය නිෂ්පාදක අතිරික්තය හා සුබ සාධන පාඩුව නිවැරදිව දක්වෙන්නේ,

| පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදක අතිරික්තය | සුබසාධන පාඩුව |
|---|---|---|
| 1) A + B + C | E + D | I |
| 2) A | B + C + D + E + J | C + D |
| 3) A | E + D | I |
| 4) A + B + C | B + C + D + E + J | C + D + G + H + I |
| 5) A | B + C + D + E + J | C + D + G + H + I |

(15) කෙටි කාලයේදී නිෂ්පාදන ආයතනයක අවම නිමවුම ඉම වනු

1) ආන්තික පිරිවැය වක්‍රයේ (MC) අවම ලක්ෂ්‍යයයි.

2) සාමාන්‍ය පිරිවැය වක්‍රයේ (AC) අවම ලක්ෂ්‍යයයි.

3) සාමාන්‍ය විචල්‍ය වක්‍රයේ (AVC) අවම ලක්ෂ්‍යයයි.

4) සාමාන්‍ය පිරිවැය වක්‍රයේ (AFC) අවම ලක්ෂ්‍යයයි.

5) සාමාන්‍ය පිරිවැය හා ආන්තික පිරිවැය සමාන වන ලක්ෂ්‍යයයි.



Scanned with CamScanner

(16) එක් නිෂ්පාදන ආයතනයක මුළු ස්ථාවර පිරිවැය (TFC) රු. 50 කි. ආයතනයක නිමැවුම හා පිරිවැය පිළිබඳ පහත තොරතුරු සපයා ඇත.

| නිමැවුම (Q) | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| ආන්තික පිරිවැය (Mc) | 30 | 25 | 28 | 35 | 38 |

නිමැවුම් ඒකක තුනේදී මුළු විචල්‍ය පිරිවැය (TVC) හා මුළු පිරිවැය (TC) වනුයේ,


1) TVC = 0 , TC = 85 2) TVC = 55 , TC = 140 3) TVC = 118 , TC = 168

4) TVC = 58 , TC = 108 5) TVC = 35 , TC = 80

(17) කිසියම් ආයතනයක් භාණ්ඩයක් නිෂ්පාදනය කොට ප්‍රමාණික ලාභ පමණක් උපයන්නේ නම්,

1) ආයතනයේ මුළු ආදායම මුළු ආර්ථික පිරිවැයට සමානය.
2) ආයතනයේ මුළු ආදායමමුළු සෘජු පිරිවැයට සමානය.
3) ආයතනයේ මුළු ආදායම මුළු සෘජු පිරිවැය ඉක්මවා යනු ඇත.
4) ආයතනයේ මුළු ආදායම සෘජු සහ ආර්ථික පිරිවැය යන දෙකෙහි එකතුවට සමානය.
5) ආයතනයේ ආර්ථික පිරිවැය සෘජු පිරිවැය ඉක්මවා යනු ඇත.

(18) තරඟකාරී ශ්‍රම වෙළෙඳපොළේ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත දක්වේ.




ශ්‍රම වෙළෙඳපොළ සමතුලිතව පවතින්නේ නම් ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපයුම් නිවැරදිව නිරූපණය වනුයේ,

| **ආර්ථික බදු කුලී** | **සංක්‍රාම ඉපයුම්** |
|---|---|
| 1) ACD | BCD |
| 2) BCD | ODCQ |
| 3) ODCQ | OBCQ |
| 4) BCD | ABC |
| 5) ABC | ODCA |

(19) පහත දක්වෙන්නේ ආර්ථිකයක ජාතික ගිණුම් තොරතුරු වේ. (සියලුම සංඛ්‍යා රුපියල් බිලියන වලින්)

මුළු පරිභෝජන වියදම 1200
පෞද්ගලික පරිභෝජන වියදම 800
රජයේ සමූහ පරිභෝජන වියදම 150

ඉහත තොරතුරු ඇසුරින් සත්‍ය පුද්ගලීකෘත පරිභෝජන වියදම් ගණනය කළ විට ලැබෙන අගය වන්නේ,

1) රු.බි. 950 2) රු. බිලි. 550 3) රු.බිලි. 400 4) රු.බිලි. 1050 5) රු.බිලි. 2150



Scanned with CamScanner

(20) දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය යන්නට අයත් නොවන අයිතමය වන්නේ,

1) තොග (පරිලේඛන) 2) යන්ත්‍රෝපකරණ හා ආයුධ

3) බුද්ධිමය දේපළ ආශ්‍රිත නිෂ්පාදන 4) නිවාස හා ඉදිකිරීම්

5) වගාකළ ජෛව විද්‍යාත්මක සම්පත්

(21) ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් පිළියෙළ කිරීමේදී පදනම් වර්ෂය ලෙස මෙතෙකට යොදාගන්නා වර්ෂය වනුයේ,

1) 2000 වර්ෂයයි 2) 2010 වර්ෂයයි 3) 2015 වර්ෂයයි

4) 2005 වර්ෂයයි 5) 2020 වර්ෂයයි.

(22) තෝරාගන්නා ලද ආර්ථිකයක සැබෑ ආර්ථික දත්ත කිහිපයක් පහත දැක්වේ. (සංඛ්‍යා රුපියල් බිලියන වලිනි)

| | |
|---|---|
| සේවක ආදායම් | 850 |
| පොලී ආදායම් | 250 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 150 |
| බදුකුලී ආදායම් | 200 |
| ලාභ හා ලාභාංශ | 300 |
| මිශ්‍ර ආදායම් | 450 |

දළ මෙහෙයුම් අතිරික්තයේ අගය වන්නේ,

1) රු.බිලි. 900 2) රු. බිලි 1350 3) රු. බිලි. 1750 4) රු.බිලි. 2200 5) රු.බිලි. 1300

(23) ආයෝජන වියදම් රු.බිලි. 100 සිට 150 දක්වා වැඩිවන විට සමතුලිත ජාතික නිමැවුම රු.බිලි. 1000 සිට 1200 දක්වා වැඩි වූයේ නම් වියදම් ගුණකයේ අගය වන්නේ,

1) 4කි. 2) 0.25කි. 3) 5කි. 4) 10කි. 5) 8කි.

(24) නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1) ආන්තික ඉතුරුම් හා ආන්තික පරිභෝජන අනුපාත වල අගය එකිනෙකට සමාන වේ.

2) පෞද්ගලික ඉතුරුම් ජාතික ආදායමේ වෘත ප්‍රවාහයේ එකතුවීමක් වේ.

3) ස්වායත්ත පරිභෝජන වියදමක් නොපවතින විට ආන්තික පරිභෝජන අනුපාතයේ හා සාමාන්‍ය පරිභෝජන අනුපාතයේ අගයන් සමාන වේ.

4) ස්වායත්ත පරිභෝජනයක් පවතින විට ආන්තික පරිභෝජන අනුපාතයට වඩා සාමාන්‍ය පරිභෝජන අනුපාතය අඩු අගයක් ගනී.

5) පරිභෝජන වියදම් හා ආයෝජන වියදම් සමාන වන අවස්ථාව සරල ආර්ථිකයේ සමතුලිත කොන්දේසියයි.

(25) ධන නිමැවුම් පරතරයක් පවතින ආර්ථිකයක

1) උපයෝජනය නොකළ නිෂ්පාදන ධාරිතාවක් පවතී.

2) චක්‍රීය සේවා වියුක්තියක් පවතී.

3) සැබෑ නිමැවුම විභව නිමැවුමට වඩා අඩුය.

4) ආර්ථික සම්පත් වල වේගයෙන් පසුබැසීමක් දක්නට ඇත.

5) ඉල්ලුමෙන් ඇදුණ උද්ධමනීය පීඩනයක් දක්නට ලැබේ.

(26) රටක මුදල් සැපයුම තීරණය කරන සාධකයක් නොවන්නේ,

1) බැංකු ක්‍රමය මගින් රජයට සපයන ශුද්ධ ණය 2) වාණිජ බැංකු මගින් පුද්ගලික අංශයට සපයන ණය

3) බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් 4) බැංකු ක්‍රමය සතු අනෙකුත් ශුද්ධ වත්කම්

5) මහජනයා සතු ව්‍යවහාර මුදල්



Scanned with CamScanner

(27) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ලෙස හඳුන්වන්නේ,

1) මහජනතාව වාණිජ බැංකුවල තැන්පත් කළ යුතු අවම මුදල් ප්‍රමාණයයි.
2) වාණිජ බැංකු සතු මුදල් වලින් මහ බැංකුවේ තැන්පත් කළ යුතු මුදල් ප්‍රමාණයයි.
3) වාණිජ බැංකුවලට සැපයිය හැකි උපරිම ණය ප්‍රමාණයයි.
4) වාණිජ බැංකු සතු ද්‍රවශීල වත්කම් ප්‍රමාණයයි.
5) වාණිජ බැංකුවක ද්‍රවශීලතාවය හා ලාභදායීතාවය අතර අනුපාතයයි.

(28) ආර්ථිකයේ ද්‍රවශීලතාවය ඉහළ මට්ටමක පවතින විට සීරණය කළ හැක්කේ මහ බැංකුව,

1) නිත්‍ය තැන්පතු හා නිත්‍ය ණය පහසුකම් අනුපාත ඉහළටම සංශෝධනය කිරීම.
2) වාණිජ බැංකු සමග ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම්වලට එළඹීම.
3) නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය පහළට සංශෝධනය කිරීම.
4) නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පහළට සංශෝධනය කිරීම.
5) පොලී අනුපාත කොරිඩෝව පහළට සංශෝධනය කිරීම.

(29) මහ බැංකුව විසින් සංචිත අනුපාතය ඉහළ දැමූ විට,

| | වාණිජ බැංකු සංචිත | මුදල් සැපයුම | පොලී අනුපාතිකය |
|---|---|---|---|
| 1) | වැඩිවේ | වැඩිවේ | වැඩිවේ |
| 2) | වැඩිවේ | අඩුවේ | වැඩිවේ |
| 3) | අඩුවේ | අඩුවේ | අඩුවේ |
| 4) | අඩුවේ | අඩුවේ | වැඩිවේ |
| 5) | වැඩිවේ | අඩුවේ | අඩුවේ |

(30) උද්ධමනය අඩුකිරීමේ පියවරක් ලෙස සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තියේ කාර්යයක් ලෙස සැලකිය හැක්කේ,

1) අලුත් ආයතනවලට වෙළඳපොළ ප්‍රවේශයට ඉඩ සැලසීම.
2) ආනයන සීමා කිරීමෙහිලා ආරක්ෂණ ක්‍රියාමාර්ග දැඩි කිරීම.
3) ව්‍යාපාර වල අධික ලාභ පාලනයට බදු පැනවීම.
4) මුදල් සැපයුමේ සංකෝචනය
5) නියාමන හරණය තුළින් වෙළඳපොළ නිර්බාධීකරණය කිරීම.

(31) 2019 වසරේ ශ්‍රී ලංකාවේ බදු ආදායම් තුළ වැඩිම දායකත්වයක් දක්වන ලද අයිතමය වන්නේ,

1) එකතුකළ අගය මත බදු හා නිෂ්පාද බද්ද
2) එකතුකළ අගය මත බදු හා අගෙනතුන් බද්ද
3) එකතු කළ අගය මත බදු හා ආදායම් බද්ද
4) ආදායම් බදු හා නිෂ්පාදන බද්ද
5) නිෂ්පාදන බදු හා ආනයන බද්ද

(32) ශ්‍රී ලංකාවේ මුළු වියදම් තුළ පුනරාවර්තන වියදම්වල දායකත්වය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස

1) 13.6 2) 13.4 3) 15.2 4) 15.8 5) 16.2

(33) බදු අයකිරීමේ අරමුණු සපුරා ගැනීමේදී යහපත් බදු ක්‍රමයක් තුළ පැවතිය යුතු ලක්ෂණයක් ලෙස නොගැලපෙන්නේ කුමක් ද?

1) අකාර්යක්ෂමතා ඇති නොවීම.
2) පිරිවැය අවම වීම
3) සාධාරණත්වය ආරක්ෂා වීම.
4) බදු එකතු කර ගැනීමට පහසු වීම.
5) බදු පැහැර හැරීමට ඇති හැකියාව



Scanned with CamScanner

(34) වෙළඳපොළ ක්‍රියාකාරිත්වය නැංවීමට මැදිහත් වීම නිසා පහත සඳහන් කුමන හේතුව මත ආණ්ඩුව අසමත් වේද?

1) දේශපාලන ඇඟිලිගැසීම්    2) පොදු සම්පත් අධි පරිභෝජනය

3) සම්පත් බෙදීයාමේ අකාර්යක්ෂමතා ඇතිවීම.    4) බාහිරතා ජනනය වීම.

5) වෙළඳපොළ අපේක්ෂිත ආකාර ඌනතා හටගැනීම.

(35) රාජ්‍ය අයවැය ශේෂයක වර්තන ගිණුමේ 'හිඟයක්' මගින් පැහැදිලි වන්නේ එරට

1) වර්තන හා ප්‍රාග්ධන වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොමැති බවයි.

2) වර්තන වියදම් පියවා ගැනීමට බදු ආදායම ප්‍රමාණවත් නොවන බවයි.

3) ආණ්ඩුවේ රාජ්‍ය ඉතුරුම් ධන අගයක් ගන්නා බවයි.

4) ප්‍රාග්ධන වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොමැති බවයි.

5) ප්‍රාග්ධන වියදම් සහලයකින් සිදුවී ඇති බවයි.

(36) ජාත්‍යන්තර විශේෂීකරණයට පාත්‍ර වෙමින් නිෂ්පාදන අතින් ලොව අංක එකේ සැපයුම්කරු බවට පත් භාණ්ඩය හා රට ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1) සුඛෝපභෝගී මෝටර් රථ - ජර්මනිය, ඔරලෝසු - ස්විට්සර්ලන්තය, මෝස්තර නිරූපණය - ඉතාලිය, මෘදුකාංග - ඇමරිකාව

2) මෝස්තර නිරූපණය - ඉන්දියාව, ඔරලෝසු - ස්විට්සර්ලන්තය, මෘදුකාංග - ඇමරිකාව, තාක්ෂණික භාණ්ඩ - කොරියාව

3) වීදුරු - ඉන්දියාව , ඔරලෝසු - ස්විට්සර්ලන්තය, මෘදුකාංග - කොරියාව, සුඛෝපභෝගී මෝටර් රථ - ජර්මනිය

4) මෝස්තර නිරූපණය - ඉතාලිය, මෘදුකාංග, ඇමරිකාව, ඔරලෝසු - තායිලන්තය, කිරිපිටි - ස්විට්සර්ලන්තය

5) මෘදුකාංග - ඇමරිකාව, තාක්ෂණික භාණ්ඩ - කොරියාව, ඔරලෝසු - ස්විට්සර්ලන්තය, ජපානය - මෝටර් රථ

(37) 'විශේෂ ගැණුම් හිමිකම්' (SDR) සම්බන්ධයෙන් නිවැරදි නොවන ප්‍රකාශය වන්නේ,

1) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 1969 වසරේදී හඳුන්වා දෙන ලදී.

2) වි.ගැ.හි අන්තර්ජාතික මුදලක් ලෙස පිළිගැනේ.

3) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජික රටවල් සමග සිදු කරන ගනුදෙනු ගිණුම්ගත කිරීම සඳහා භාවිත කරයි.

4) විශේෂ ගැණුම් හිමිකම් අන්තර්ජාතික මුදලක් ලෙස පිළි නොගැනේ.

5) ජාත්‍යන්තර සංචිත වත්කම් විශේෂයකි.

(38) ශ්‍රී ලංකාව හා ඉන්දියාව එක් ශ්‍රමිකයකුගෙන් දවසකට ලබාගත හැකි නිමැවුම් පිළිබඳ දත්ත පහත දක්වේ.

| රට | ගවුම | සාරි |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 8 | 4 |
| ඉන්දියාව | 8 | 2 |

මෙම දත්ත වලට අනුව ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවතින නිදහස් වෙළඳාම සම්බන්ධයෙන් පහත ප්‍රකාශ තුළින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1) රටවල් 2ටම භාණ්ඩ 2කම නිපදවීමේ සාපේක්ෂ වාසියක් ඇත.

2) ගවුම් නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය පවතින්නේ ශ්‍රී ලංකාවටයි.

3) කිසිදු රටක් නිරපේක්ෂ වාසියට හිමිකම් නොකියයි.

4) ඉන්දියාව ගවුම් නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය හිමිකරගෙන ඇත.

5) ශ්‍රී ලංකාව ගවුම් අපනයනය කළ යුතු වේ.



Scanned with CamScanner


(39) ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ සංචාරක හෝටලයක කොටස් ඉන්දියානු සමාගමක් විසින් මිලදී ගැනීම ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයේ පෙන්නුම් කරන්නේ,

1) ප්‍රාග්ධන ගිණුම් හර ශේෂයක් ලෙස
2) මූල්‍ය ගිණුම් බැර ශේෂයක් ලෙස
3) ප්‍රාග්ධන ගිණුමේ හර ශේෂයක් ලෙස
4) මූල්‍ය ගිණුම් හර ශේෂයක් ලෙස
5) ප්‍රාග්ධන ගිණුමේ හා මූල්‍ය ගිණුමේ පිළිවෙළින් බැර සහ හර ශේෂ ලෙස

(40) අපනයන ඉපැයුම්වල ආනයන ක්‍රය ශක්තිය මැනීම සඳහා භාවිත කළ හැකි සූත්‍රය වන්නේ,

1) $\frac{\text{අපනයන වටිනාකම}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$
2) $\frac{\text{අපනයන වටිනාකම් දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$
3) $\frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times$ අපනයන පරිමා දර්ශකය
4) භාණ්ඩ වෙළඳ අනුපාතය × අපනයන පරිමා දර්ශකය
5) $\frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$

(41) ශ්‍රී ලංකාව ජපානයෙන් මෝටර් රථ ආනයනය කිරීම සම්බන්ධ රූප සටහනක් පහත දැක්වේ.




අබදු වෙළඳාම යටතේ ශ්‍රී ලංකාව ආනයනය කරන මුළු මෝටර් රථ ප්‍රමාණය කොපමණ ද?

1) 100 2) 200 3) 300 4) 400 5) 500

(42) මෝටර් රථ සඳහා පනවනු ලබන ආනයන තීරු බදු නිසා අහිමි වන ශුභ සාධනය කොපමණ ද?

1) A + B
2) C + D + E + F
3) A + C + D
4) D + E
5) C + F

(43) ලෝක සන්තෝෂ දර්ශකය නියෝජනය කරන සාධක පමණක් ඇතුළත් කොටුව වන්නේ,

1) සංස්කෘතිය, සෞඛ්‍ය, පරිසරය, යහපාලනය
2) සෞඛ්‍ය, පරිසරය, ජීවනෝපාය, අධ්‍යාපනය
3) මානසික සංතුෂ්ටිය, සංස්කෘතිය, සමාජාත්මිකභාවය
4) ජීවන තත්ත්වය, යහපාලනය , සංස්කෘතිය, සෞඛ්‍ය
5) මානසික සංතුෂ්ටිය, සෞඛ්‍ය, සංස්කෘතිය, ජීවන තත්වය

(44) 2019 වර්ෂයට අදාළ දළ උපත් අනුපාතය, දළ මරණ අනුපාතය , ශුද්ධ සංක්‍රමණ, අනුපිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.

1) 14.6% , 6.6% , -2.3%
2) 15.1% , 6.4% , 2.0%
3) 14.6% , 6.0% , 1.9%
4) 15.1% , 6.6% , 2.3%
5) 14.6% , 6.00% , -2.3%



Scanned with CamScanner

(45) සමාජ, ආර්ථික හැටලු ජනිත කරවන රැකියාවක් කිරීමට කැමැත්තෙන් සිටියත් එයට අවස්ථාවක් නොමැති තත්ත්වය,

1) ඌන සේවා නියුක්තිය වේ
2) ඉච්ඡානුගත සේවා වියුක්තිය
3) අනිච්ඡානුගත සේවා වියුක්තිය
4) ස්වයං සේවා වියුක්තිය
5) චක්‍රීය සේවා වියුක්තිය

(46) මිනිස් ජීවිතයට වඩාත් වැදගත් අත්‍යවශ්‍ය කරුණු තුනක විශිෂ්ටතාව මත දරිද්‍රතාව මිනුම් කිරීම සිදුවේ. එම අත්‍යවශ්‍ය කරුණු 3 වන්නේ,

1) සෞඛ්‍ය, පෝෂණය, ජීවන තත්ත්වය
2) අධ්‍යාපනය, ආරක්ෂාව, ජීවන තත්ත්වය
3) අධ්‍යාපනය, සෞඛ්‍ය, ආරක්ෂාව
4) අධ්‍යාපනය, පෝෂණය, සෞඛ්‍ය
5) සෞඛ්‍ය, අධ්‍යාපනය, ජීවන තත්ත්වය

(47) කිසියම් රටක සියලු ම ආදායම් උපයන්නන් එක හා සමාන ආදායම් මට්ටමින් උපයනු ලැබුවේ නම්, එහි සංගුණකය සඳහා ලැබිය හැකි අගය විය හැක්කේ,

1) අපරිමිත වේ.
2) ශුන්‍ය වේ.
3) 1.0 වේ.
4) 0.1 වේ.
5) 0.5 වේ.

(48) යම් ආර්ථිකයක යැපුම් අනුපාතය අඩුවීමට පහත සඳහන් දෑ අතරින් කුමක් බලපාවිද?

1) විභව ශ්‍රම බලකායේ වැඩිවීමක්.
2) සේවා නියුක්ති ජනගහනයේ අඩු වීමක්.
3) වැඩිහිටි ජනගහනය වැඩිවීමක්.
4) සේවා වියුක්ති ජනගහනය අඩු කිරීමක්
5) මරණ අනුපාතය පාලනය කිරීම.

(49) "නීල ආර්ථිකය" යන සංකල්පයෙන් අදහස් වන්නේ කුමක්ද?

1) වන ගහනයට හානියක් නොවන ලෙස රටක් ඉහළ ආර්ථික වර්ධනයක් කරා මෙහෙයවීමයි.
2) පරිසර දූෂණය අවම වන අකාරයෙන් ඉහළ ආර්ථික වර්ධන ඉලක්කයක් කරා ළඟාවන්නේ කෙසේද යන්න විග්‍රහ කිරීමයි.
3) ස්වභාවික සම්පත් තිරසර අයුරින් කළමනාකරණය කරනු ලබන ආර්ථික ක්‍රියාවලියකි.
4) රටක ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරන ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කරන තත්ත්වයකි.
5) සාගර සම්පත් තරසර අයුරින් යොදාගෙන ඉහළ ආර්ථික වර්ධනයක් කරා යමින් කරන්නේ කෙසේද යන්නයි.

(50) කොවිඩ් 19 වසංගතයට පෙර ශ්‍රී ලංකාවේ ප්‍රධානතම විදේශ විනිමය ඉපයීම් මාර්ග තුන අනුපිළිවෙළට දක්වෙන්නේ,

1) තේ අපනයනය, ඇඟලුම් අපනයනය හා සංචාරක කර්මාන්තයේ ඉපයීම්
2) ඇඟලුම් අපනයනය, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ හා සංචාරක කර්මාන්තයේ ඉපයීම්
3) විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, ඇඟලුම් අපනයනය හා සංචාරක සේවා ඉපයීම්
4) විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, සංචාරක සේවා ඉපයීම් හා ඇඟලුම් අපනයනය
5) තේ අපනයන, ඇඟලුම් අපනයනය හා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණය


PAST PAPERS WIKI

Scanned with CamScanner